# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 566 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 01/04/2024 පැය 2255

## මාධ්‍ය නිවේදනය

**කේරළ ගංජා සමඟ සැකකරුවන් 08 ක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ පුත්තලම ඒකකය.**

කේරළ ගංජා තොගයක් වෑන් රථයකින් ප්‍රවාහනය කරන බවට පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ පුත්තලම ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.04.01 වන අද දින සවස් කාලයේදී පුත්තලම පොලිස් වසමේ බංගදෙනිය ප්‍රදේශයේ මාර්ග බාධකයකදී වැටලීමක් සිදුකර කේරළ ගංජා කිලෝ 02 කට වැඩි බරකින් යුත් පාර්සල් 12 ක් වෑන් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32, 33, 45 හා 48 වයස්වල පසුවන පරාක්‍රමපුර, හැටන්, මාතර හා ඌරගස්මංහන්දිය ප්‍රදේශවල පදිංචි රාජ්‍ය නිලධාරීන් වේ.**

මොවුන්ගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී අනාවරණය කරගත් තොරතුරු මත මීගමුව ප්‍රදේශයේදී කේරළ ගංජා පාර්සල් 10 ක් සමඟ තවත් සැකකරුවන් දෙදෙනෙකු සහ ඔවුන්ට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**එම අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30, 41, 55 හා 64 වයස්වල පසුවන මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් පාර්සල් 22 හි **කේරළ ගංජා කිලෝ 48 ග්‍රෑම් 452** ක් තිබී ඇති අතර, වැටලීම සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**